# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,111 - 2019 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2019.02.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මාර්තු 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## වැලිගම නගර සභාව

වැලිගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| 1. රියැදුරු III ශ්‍රේණිය | 01 | රා.ප.ච. 3/2016 අනුව PL-3-2016 වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර රු. 25,790- 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක් (6) ක් සමත්ව තිබිය යුතුය.<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ වසර 03 ක පලපුරුද්ද ලබා තිබීම. |
| 2. කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | රා. ප. ච. 3/2016 අනුව PL-1-2016 වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයයන් හයක් (6) ක් සමත්ව තිබිය යුතුය. |
| 3. පුස්තකාල සහායක III ශ්‍රේණිය | 01 | රා. ප.ච. 3/2016 අනුව PL-1-2016 වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයයන් හයක් (6) ක් සමත්ව තිබිය යුතුය. |
| 4. සෞඛ්‍ය කම්කරු | 02 | රා. ප. ච. 3/2016 අනුව PL - 1-2016 වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| 5. සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) | 10 | දෛනික වැටුප් | 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| 6. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත්) | 01 | දෛනික වැටුප් | අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක් (6) ක් සමත්ව තිබිය යුතුය.<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ වසර 03 ක පලපුරුද්ද ලබා තිබීම. |

*පොදු සුදුසුකම් :-*

i. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

ii. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක සහ මෝටර් රථ රියැදුරන් සඳහා පූර්වාසන්න වසර 05 ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය අනුව අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර පදිංචිය සනාථ කර තිබිය යුතුය.

iii. සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iv. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

v. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු කරනු ලැබූවකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

*සේවයේ නිරත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේ දී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

ii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර වසර 03 ක පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම යහපත් තත්වයේ පවතින අයට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදනය කරනු ලැබේ. වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

iii. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලටද, පළාත් සභා හා පළාත් රාජ්‍ය සේවයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් චක්‍රලේඛ හෝ රෙගුලාසිවලට හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට සියලුම සේවකයින් බැඳී සිටී.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත 2019.03.15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, වැලිගම නගර සභාව, වැලිගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය වැලිගම නගර සභාවේ ලේකම් සතු වේ.

අයදුම්පත් ඉදිරිපත්කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ.
අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාහන පැදවීමේ බලපත්‍රයේ පිටපතක් (රියදුරු හා බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා),
4. පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය. (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තැබිය යුතුය.),
5. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
6. පළපුරුද්ද පිළිබඳ සහතිකය.

රෙහාන් ඩී. ඩබ්ලිව්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 ජනවාරි මස 22 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

**................................................................ තනතුර සඳහා අයදුම්පත**

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————————
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————
3. තැපැල් ලිපිනය:——————————————
4. දුරකථන අංකය:
5. උපන් දිනය :

   වර්ෂය :——————, මාසය :——————, දිනය :——————.
6. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

   අවුරුදු:——————, මාස:——————, දින:——————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————
9. විවාහක/අවිවාහක භාවය:——————————————
10. ජාතිය:——————————————
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————
12. අධ්‍යාපන සුදුසුකම් :——————————————————————————————
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————————————————————————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුර තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඕප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

02-509

---

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පිරවීම

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කණිෂ්ඨ සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන , අර්ධ ශිල්පීය හා ශිල්පීය සේවා ගණයන්හි පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරා පත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට සහ අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ දැනටමත් තාවකාලික, අනියම්,ආදේශක, කොන්ත්‍රාත්, ලියාපදිංචි පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | රියදුරු III ශ්‍රේණිය | 01 | රා.ප.චක්‍රලේඛ 3/2016 (PL-03-2016) අනුව මාසික රු. 25,790- 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 (රා.ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.) | (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය.<br><br>(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන ලද මෝටර් රථ පැදවීම් බලපත්‍රයක් ලබා තිබිය යුතුයි.<br><br>(iii) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ (ආයතනයේ) පුරප්පාඩු රියදුරු තනතුරේ ප්‍රවාහන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමට හැකි වන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ 4)මට්ටමේ සහතිකයක් ලබා තිබියයුතුයි.<br><br>(iv) රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුයි.<br><br>කායික සුදුසුකම් :<br><br>අවම උස අඩි 5ක් විය යුතුයි.<br><br>දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික හා මානසික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතුය.<br><br>මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br><br>රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් කායික යෝග්‍යතාවය සනාථ කළ යුතුයි. |
| 02. | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | රා.ප.චක්‍රලේඛ 3/2016 (PL-03-2016) අනුව මාසික රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රා.ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) ක් එකවර සමත් විය යුතුයි.) |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 03. | අදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | 01 | රා.ප.චක්‍රලේඛ 03/2016 (PL-02-2016) අනුව මාසික රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 (රා.ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුයි.<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) අවම වශයෙන් දෙවෙනි මට්ටමේ නිපුනතාවයක් ලබා තිබීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 04. | මුරකරු III ශ්‍රේණිය | 01 | රා.ප.චක්‍රලේඛ 03/2016 අනුව (PL-01-2016) අනුව මාසික රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රා.ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හය(06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) ක් එකවර සමත් විය යුතුයි.) |
| 05. | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 01 | රා.ප.චක්‍රලේඛ 03/2016 අනුව (PL-01-2016) අනුව මාසික රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රා.ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| 06. | වැඩ ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 01 | රා.ප.චක්‍රලේඛ 3/2016 අනුව (PL-01-2016) අනුව මාසික රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රා.ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක අනුගාමී වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ දඬුවම් ලැබුවෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතුය.

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(vii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වේ.

03. අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව එක් එක් තනතුරට අදළ විධිමත් ලිඛිත පරීක්ෂණ/වාචික පරීක්ෂණ/ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ/ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ/වෘත්තීය සම්මුඛ පරීක්ෂණ යන පරීක්ෂණවලින් එකකට හෝ කිහිපයකට හෝ සියල්ලටම අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර එහිදී ලබා ගන්නා සියලුම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ. (කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන ඇති විට ඒ අතුරින් බඳවාගනු ලබන තැනැත්තා කවුරුන් ද යන්න අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් තීරණය කරනු ලබන ආකාරයකට වේ.

04. කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන පමණින් හෝ එම පරීක්‍ෂණවලට භාජනය කළ පමණින් එම අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සකු ලෙස සලකනු නොලැබේ.

*05. සේවයේ නියුක්ත කිරීම පිළිබඳ කොන්දේසි :*

(1) මෙම පත්වීම ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

(2) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර වසර 03 ක් අවසානයේ වැඩ/පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක තිබෙන සේවකයිනට පමණක් පත්වීම ස්ථිර කරනු ලැබේ. එමෙන්ම පරිවාස කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

(3) දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත කණිෂ්ඨ සේවක සේවයේ උක්ත තනතුරුවලට අදළ සේවා ව්‍යවස්ථා සංග්‍රහවලට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දකුණු පළාතේ පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින්වර පනවනු ලබන කොන්දේසිවලටද, පළාත් පාලන ආයතනවලට අදළ අණපනත්වල විධිවිධානවලට ද අම්බලන්තොට ප්‍රාදේශීය සභාව මගින් වරින් වර ගනු ලබන සභා සම්මුතිවලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

(4) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුයි.

*06. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘති ප්‍රකාරව A 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "සභාපති, අම්බලන්තොට ප්‍රාදේශීය සභාව, අම්බලන්තොට"යන ලිපිනයට 2019.02.28 දින ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "............................තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

(iii) තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(iv) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුයි.

(v) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතර, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(vi) අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ ඡායාපිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය :

(a) උප්පැන්න සහතිකය,
(b) ජාතික හැඳුනුම්පත,
(c) අධ්‍යාපන සහතික,
(d) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය,
(e) වෘත්තීය හා වෙනත් සුදුසුකම් සහතික,
(f) මෑතකදී ලබා ගත් චරිත සහතික 03 ක් (එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබා ගත යුතුය.)

අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සහ සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් තෝරා ගැනීමට පෙර අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වන අතර, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් හෝ නොගෙවා සේවයේ යෙදී සිටින කවර අවස්ථාවකදී වුවද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

එම්. ආර්. පී. දර්ශන සංජීව,
සභාපති,
අම්බලන්තොට ප්‍රාදේශීය සභාව.

2019 ජනවාරි 28 වැනි දින,
අම්බලන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**අම්බලන්තොට ප්‍රාදේශීය සභාව**

*.....................................තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
3. ස්ථිර පදිංචි ලිපිනය:——————————————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————.
5. විවාහක/අවිවාහක භාවය:——————————————.
6. (i) උපන් දිනය:

   වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.

   (ii) 2019.02.28 වැනි දිනට වයස : අවුරුදු :——————. මාස:——————. දින:——————.

7 ජාතික හැඳුනුම්පත් අංකය:——————————————.

8. ජාතිය/ආගම:——————————
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————.
10. දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————————.
11. අධ්‍යාපන සුදුසුකම්(සහතික පිටපත් අමුණා එවන්න.) :——————————————————————.
12. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————————.
13. වෙනත් සුදුසුකම්:——————————.
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්, එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ලියාපදිංචි):——————————
15. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී තිබේද?:——————————.

    තිබේනම් ඒ පිළිබඳ විස්තර :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරුවලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කිරීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වරදකරු වී නොමැති බව ද, මාගේ සුපුරුදු අත්සන තබා සහතික කරමි.

——————————
අයදුම්කරුගේ අත්සන

දිනය :——————

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුර නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවත්, ............................වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

_ ____________

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය ____________

02-546

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පිරවීම

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කණිෂ්ඨ සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය සේවා ගණයන් හි පහත සඳහන් තොරතුරු සඳහා සුදුස්සන් තෝරා පත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට සහ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ දැනටමත් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, ලියාපදිංචි පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *අනු අංකය* | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | 01 | රා.ප. චක්‍රලේඛ 03/2016 (PL-02-2016) අනුව මාසික රු. 25,250- 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 (රා. ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.) | (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ඕනෑම විෂයන් 06 ක් සමත් වී තිබිය යුතුයි.<br>(ii) අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N. V. Q) අවම වශයෙන් දෙවෙනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.<br>(iii) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක III ශ්‍රේණිය | 01 | රා.ප. චක්‍රලේඛ 03/2016 (PL-01-2016) අනුව මාසික රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (රා. ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටවනු ලැබේ.) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. |
| 03 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 02 | රා. ප. චක්‍රලේඛ 03/2016 (PL-01-2016) අනුව මාසික රු. 24,250- 10 x 250 - 10 x 270 රු. 36,410 (රා.ප. චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටවනු ලැබේ.) | 8 වන ශ්‍රේණිය (9 වසර ) සමත්ව තිබීම. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

i. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක අනුගාමී වසර 03 ක් අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සථිර පදිංචිය සනාථ කළ යුතුය.

iv. අයදුම්පත් භාර ගන්න අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදළ නොවේ.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ දඬුවම් ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

vi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

vii. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති සතුවේ.

03. අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව එක් එක් තනතුරට අදාළව විධිමත් ලිඛිත පරීක්ෂණ/වාචික පරීක්ෂණ/ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ/ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ/වෘත්තීය සම්මුඛ පරීක්ෂණ යන පරීක්ෂණවලින් එකකට හෝ කිහිපයකට හෝ සියල්ලටම අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර එහිදී ලබා ගන්නා සියලුම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ගෙන ඇති විට ඒ අතුරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන් ද යන්න අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් තීරණය කරනු ලබන ආකාරයකට වේ.

04. කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන පමණින් හෝ එම පරීක්ෂණවලට භාජනය කළ පමණින් එම අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීම පිළිබඳ කොන්දේසි :*

1. මෙම පත්වීම ස්ථිර ය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.
2. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර 03 ක් අවසානයේ වැඩ/පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක තිබෙන සේවයකයින්ට පමණක් පත්වීම ස්ථිර කරනු ලැබේ. එමෙන්ම පරිවාස කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.
3. දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත කණිෂ්ඨ සේවක සේවයේ උක්ත තනතුරුවලට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහවලට අමතරව ආයතන සංග්‍රහයේ විධි විධානවලටද, මුදල් රෙගුලාසිවලට ද, දකුණු පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින්වර පනවනු ලබන කොන්දේසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ අණපනත්වල විධිවිධානවලට ද, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව මගින් වරින්වර ගනු ලබන සභා සම්මුතිවලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.
4. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුයි.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය:*

i. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘති ප්‍රකාරව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර ''සභාපති, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව, අඟුණකොළපැලැස්ස'' යන ලිපිනයට 2019.03.08 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ii. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ'' ............................................ තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

iii. තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

iv. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුයි.

v. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතර, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

vi. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

a. උප්පැන්න සහතිකය
b. ජාතික හැඳුනුම්පත
c. අධ්‍යාපන සහතිකය
d. පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය
e. වෘත්තීය හා වෙනත් සුදුසුකම් සහතික
f. මෑතකදී ලබා ගත් චරිත සහතික 03ක් (එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරීවරයාගෙන් ලබාගත යුතුය.)

අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සහ සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් තෝරා ගැනීමට පෙර අයදුම්කරු නුසුදුස්සකු බවට පත්වන අතර, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් හෝ නොගෙවා සේවයේ යෙදී සිටින කවර අවස්ථාවක දී වුවද සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

ගාමිණී වීරබද්ධන,
සභාපති,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව.

2019 ජනවාරි මස 31 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව***

...................................... තනතුර සඳහා අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————
3. ස්ථිර පදිංචි ලිපිනය :——————————
4. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————
5. විවාහක/අවිවාහක බව:——————————
6. (i) උපන් දිනය අවුරුද්ද :————; මාසය :————; දිනය:————.
   (ii) 2019.03.08 වැනි දිනට වයස අවුරුදු :————; මාස :———— ; දින:————.
7. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
8. ජාතිය/ආගම:——————————
9. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————
10. දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කාලය:——————————
11. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් අමුණා එවන්න):——————————
12. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:——————————
13. වෙනත් සුදුසුකම්:——————————
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්, එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ලියාපදිංචි):——————————

15. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී තිබේද?:——————————————

තිබේ නම් ඒ පිළිබඳ විස්තර:——————————————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු වලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කිරීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි. මම කිසිඳු උසාවියකින් සාපරාධී වරදකට වරදකරු වී නොමැති බවද, මාගේ සුපුරුදු අත්සන තබා සහතික කරමි.

——————————;

අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකග වන බවත්................ ......................................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————;

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.

02-644

---

## මුලටියන ප්‍රාදේශීය සභාව

මුලටියන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ඖෂධ සංයෝජක තනතුර සඳහා දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩුව පවතින තනතුර හා ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ :

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. ඖෂධ සංයෝජක III ශ්‍රේණිය | 01 | රා.ප.ච. 3/2016 අනුව PL-2-2016 වැටුප් බාණ්ඩයේ ආරම්භක පියවර | I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය.<br>II. අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.<br>III. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු කරනු ලැබූවෙකු හෝ මීට පෙර පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

v. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත් තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

vi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

vii. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම මුලටියන ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ඉහත තනතුරට බඳවා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මත සිදු කරනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී ලබා දෙන ලකුණු ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් පහත පරිදි වේ.

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | වෘත්තීය සුදුසුකම් | 10 | |
| 3 | පළපුරුද්ද | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

ii. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.

iii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර 03 අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර 03ක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

iv. දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට අමතරව ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසිවලටද දකුණු පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පවරනු ලබන කොන්දේසිවලටද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥා පනත්/පනත්වල විධිවිධානවලටද මුලටියන ප්‍රාදේශීය සභාව මගින් වරින් වර ගනු ලබන සභා සම්මුතිවලටද අනුකූලව සේවය කිරීමට එකඟ විය යුතුය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

1. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක තමන් විසින් සකස් කරගත් අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.
2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

    i. උප්පැන්න සහතිකය;
    ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්;
    iii. අධ්‍යාපන සහතිකය;
    iv. වෘත්තීය හා වෙනත් සුදුසුකම්;
    v. පදිංචිය සහතික කිරීමේ සහතිකය;
    vi. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරීවරයාගෙන් ලබා ගත යුතුය.).

3. සියලුම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2019.02.28 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් "සභාපති, ප්‍රාදේශීය සභාව, මුලටියන" යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

06. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සහ සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් සේවයේ යෙදී සිටින කවර අවස්ථාවකදී වුව ද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

සුනිල් ඇල්ලදෙණිය,
සභාපති,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2019 ජනවාරි මස 11 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
මුලටියන.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මුලටියන ප්‍රාදේශීය සභාව

***දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන ගත කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————
2. මුලකුරු සමග නම :——————
3. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————
4. ස්ථිර ලිපිනය :——————
5. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————
6. උපන් දිනය අවුරුද්ද:—————— මාසය:—————— දිනය:——————
7. 2019.02.28 දිනට වයස අවුරුදු:—————— මාස:—————— දින:——————
8. ජාතික හැඳුනුම්පත් අංකය :——————
9. දුරකථන අංකය :——————-
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද යන වග :——————
11. විවාහක/ අවිවාහක බව :——————
12. මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :——————
13. අධ්‍යාපන සුදුසුකම් :——————
14. වෘත්තීය සුදුසුකම් :——————
15. සේවා පලපුරුද්ද :——————
16. වෙනත් විශේෂ කුසලතා :——————

මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිඳු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දන්වමි.

——————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

02-407/1

## මුලටියන ප්‍රාදේශීය සභාව

මුලටියන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු පවතින තනතුර පිළිබඳ තොරතුරු පහත පරිදි වේ :

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. වැඩ/ ක්ෂේත්‍ර කම්කරු (III) ශ්‍රේණිය | 01 | රා.ප.ව. 3/2016 අනුව PL-1-2016 වැටුප් බාණ්ඩයේ ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම |

01. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු කරනු ලැබූවෙකු හෝ මීට පෙර පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
v. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම මුලටියන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.
vi. අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 5ක හා අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
vii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

i. වැඩ/ ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් දෙනු ලබන ලකුණු මත තෝරා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
ii. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
iii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර 03 අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර 03ක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.
iv. දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අමතරව ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසිවලටද, කොන්දේසිවලටද, දකුණු පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින් වර පවරනු ලබන කොන්දේසිවලටද, පළාත් පාලන ආයතනවලට අදළ අනපනත්/පනත් වලට විධිවිධානවලටද මුලටියන ප්‍රාදේශීය සභව මගින් වරින් වර ගනු ලබන සභා සම්මුතිවලටද අනුකූව සේවය කිරීමට එකඟ විය යුතුය.

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

1. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක තමන් විසින් සකස් කරගත් අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.
2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
iii. අධ්‍යාපන සහතිකය
iv. වෘත්තීය හා වෙනත් සුදුසුකම්
v. පදිංචිය සනාථ කිරීමේ සහතිකය
vi. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබා ගත යුතුය.)

3. සියලුම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2019.02.28 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, ප්‍රාදේශීය සභාව, මුලටියන" යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගිය හොත් සේවයේ යෙදී සිටින කවර අවස්ථාවක දී වුව ද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

සුනිල් ඇල්ලදෙනිය,
සභාපති,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2019 ජනවාරි මස 11 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
මුලටියන.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මුලටියන ප්‍රාදේශීය සභාව

***මුලටියන ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————
2. මුලකුරු සමග නම :——————————
3. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————
4. ස්ථිර ලිපිනය :——————————
5. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————
6. උපන් දිනය අවුරුද්ද:——————, මාසය:——————, දිනය:——————,
7. 2019.02.28 දිනට වයස අවුරුදු:——————, මාස:——————, දින:——————,
8. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
9. දුරකථන අංකය :——————————-
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————
11. විවාහක/ අවිවාහක බව :——————————
12. මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :——————————
13. අධ්‍යාපන සුදුසුකම් :——————————
14. වෘත්තීය සුදුසුකම් :——————————
15. සේවා පළපුරුද්ද :——————————
16. වෙනත් විශේෂ කුසලතා :——————————

මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

02-407/2

## උඩපළාත ප්‍රාදේශීය සභාව

උඩපළාත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අදාළ තනතුරු හා වැටුප් පරිමාණය :*

තනතුරු වලට හිමි වාර්ෂික වැටුප් පරිමාණයන් පහත දැක්වේ :-

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *සේවක ගණය* | *ශ්‍රේණිය* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|---|
| 1 | රියදුරු | 05 | ප්‍රාථමික ශිල්පීය | III | රා. ප. ච. අංක 03/2016 PL-03/2016 රු. 25,790 - 10x270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 කි.<br><br>රා. ප. ච. අංක 03/2016 II උපලේඛනය පරිදි රු. 23,126 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>* දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 සමත්ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරක දී සමත්වී තිබිය යුතුය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br>* මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ''ජේ'' කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වෙනි මට්ටම (NVQ 4) පුහුණු සහතිකය යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය.<br><br>*පළපුරුද්ද :*<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>කායික සුදුසුකම් :<br>සෑම අපේක්ෂකයෙකුට ම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.<br><br>අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | සේවක ගණය | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|---|
| | | | | | | *වෙනත් සුදුසුකම් :*<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br>*බඳවා ගැනීමේ ක්‍රමවේදය :*<br>*** විවෘත බඳවා ගැනීම :<br>ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන් ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.<br>*** සීමිත බඳවා ගැනීම<br>කායික මානසික යෝග්‍යතාව සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය.<br>*බඳවා ගන්නා අනුපාතය :*<br>සීමිත 30%<br>විවෘත 70% |
| 2 | විදුලි කාර්මික | 01 | ප්‍රාථමික අර්ධ ශිල්පීය | III | රා.ප.ච. අංක 03/2016 -PL-02-2016<br>රු. 25,250- 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350- රු. 38,450 කි.<br>රා. ප. ච. අංක 03/2016 II උපලේඛනයේ පරිදි රු. 22,642 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>* දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br>*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*<br>* අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කර ගෙන තිබිය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | සේවක ගණය | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|---|
| | | | | | | * වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් දෙවන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම.<br>හෝ<br>* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.<br>හෝ<br>* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අද ාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>* තෘතීය හා වෘත්තීය කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>පළපුරුද්ද :<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් වසර 02 ක් වත් විය යුතුය.) |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *සේවක ගණය* | *ශ්‍රේණිය* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|---|
| 3. | ජල කම්කරු<br><br>ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01<br><br>01 | ප්‍රාථමික ශිල්පීය නොවන | III | රා.ප.ච. අංක 03/2016 PL-01-2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410<br>රා.ප.ච. අංක 03/2016 II උපලේඛනය පරිදි රු. 27,746 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>* දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 සමත්ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය. |
| 4. | මාර්ග කම්කරු<br><br>සෞඛ්‍ය කම්කරු | 09<br><br>06 | ප්‍රාථමික ශිල්පීය නොවන | III | රා.ප.ච. අංක 03/2016 PL-01-2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410<br>රා. ප. ච. අංක 03/2016 II උපලේඛනයේ පරිදි රු. 21,746 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>* දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 සමත්ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.<br>ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් නොවන අවස්ථාවක දී අධ්‍යාපන සුදුසුකම් 05 ශ්‍රේණිය සමත් දක්වා අඩු කරනු ලැබේ. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

01. රියදුරු තනතුර සඳහා වන අයදුම්කරුවන් හැර අනෙකුත් තනතුර සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

02. රියදුරු තනතුරු සඳහා ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලු ම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වන අතර හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ සඳහා යටත් විය යුතුය.

ii. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට දායක මුදල් ගෙවිය යුතුය.

iii. පත්වීම අවුරුදු 03 පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක තත්ත්වයක නොමැති වුවහොත් සේවය අවසන් කරනු ලැබේ. දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් පමණක් එක් අවුරුදු පරීක්ෂණ කාලයකට යටත්ය.

iv. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව අවශ්‍ය රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

v. සේවා ව්‍යවස්ථාවන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ ඊට අමතරව රජය, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභාව, පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් දැනටමත් නියම කර ඇති හා කලින් කලට නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලටද මෙම පත්වීම යටත් වේ.

vi. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ බඳවා ගැනීම්වලට අදාළ වන අනෙකුත් පොදු කොන්දේසි අදාළ වේ.

04. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න අඛණ්ඩ වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර, ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් පදිංචිය සනාථ කළ යුතුය. (පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටක දී පමණක් යාබද පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් සලකා බලනු ලැබේ.)

iii. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු හෝ රජයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

iv. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

v. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට අඩු විය යුතුය. (රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

vi. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.

vii. බඳවා ගැනීමට අවශ්‍ය සියලුම සුදුසුකම් කැඳවීමේ අවසන් දිනය වන විට සෑම ආකාරයකින් ම සම්පූර්ණ වී තිබිය යුතුය.

05. *අයදුම් කළ යුතු ආකාරය :*

05.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2019.03.15 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''ලේකම්, උඩපළාත ප්‍රාදේශීය සභාව, දැල්පිටිය, අටබාගේ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කල යුතුයි. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) අයදුම්පත ඒ 4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම භාවිතා කරමින් සකස් කළ යුතුය. අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේ දී සිදුවන ප්‍රමාදවීම හෝ නැතිවීම පිළිබඳ වගකීම අයදුම්කරු සතු ය.

05.2 බඳවා ගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය උඩපළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය හා මේ සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතු ය.

එස්. කේ. සමරසිංහ,
ලේකම් *(වැ. බ.),*
උඩපළාත ප්‍රාදේශීය සභාව,
දැල්පිටිය.

2019 ජනවාරි මස 30 වැනි දින.
උඩපළාත ප්‍රාදේශීය සභාවේ දීය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

***උඩපළාත ප්‍රාදේශීය සභාව***

*................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. මුලකුරු සමග නම :——————————————
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————
2. ස්ථිර ලිපිනය:——————————————
   දුරකතන අංකය:——————————————
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————————

4. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
5. උපන් දිනය : වර්ෂය:—————— මාසය:—————— දිනය:——————
6. අයදුම්පත් භාර ගන්නා දිනට වයස: අවුරුදු:—————— මාස:—————— දින:——————
7. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————
8. විවාහක/අවිවාහක බව:——————————
9. ශ්‍රී ලාංකිකයෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:——————————
10. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

අ.පො.ස. (සා. පෙළ) විභාගය
සමත් වර්ෂය:—————— විභාග අංකය :——————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |
| | | | |

11. වෙනත් සුදුසුකම් :——————————

වෘත්තීය සුදුසුකම් :——————————
සේවා පළපුරුද්ද :——————————

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටින්නේනම් දැනට දරන තනතුර
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග :——————————
එම තනතුරට පත් වූ දිනය :——————————

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:——————————

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට නුසුදුසුසෙක්වන බව හා පත්වීම භාර ගනු ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක්ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන.......................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ....................................... කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————
තනතුර:——————————
ආයතනය:——————————
දිනය:——————————

02-648

# පළාත් පාලන නිවේදන

## තිරප්පනේ ප්‍රාදේශීය සභාව

2017.06.09 වන දින අංක 2022/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසේ පළමු නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දවූ ද පහත සඳහන් උපලේඛනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (IV කොටසේ) පළ කරනු ලබන දින සිට තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවැත්විය යුතු අතුරු ව්‍යවස්ථා විය යුතු යැයි තිරප්පනේ ප්‍රාදේශීය සභාව විසින් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) උපවගන්තියට අනුව 1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 (අ) වගන්තිය සමග කියවිය යුතු 122 සහ 126 යන වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාරව මෙයින් වැළඳගන්නා ලද බව නිවේදනය කරමි.

රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ,
සභාපති,
තිරප්පනේ ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 10 වැනි දින,
තිරප්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
6. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
7. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
8. ප්‍රාදේශීය සභාවේ සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
9. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.

02- 408

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.